# විශේෂ දැනුම් දීමයි

විදේශගතව සිට නැවත ශ්‍රී ලංකාවට පැමිණි විගමනික ශ්‍රමිකයින්ට රුපියල් පනස් දහසක (රු.50,000/=ක) මුදල් ආධාරයක්, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් ලබාදෙන බවට ව්‍යාජ ප්‍රවෘත්තියක් මේ දිනවල යූ ටියුබ් (Youtube) මාධ්‍ය මඟින් ප්‍රචාරය වෙමින් පවතී.

ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචි වී රැකියා සඳහා විදේශගතව සිට කොවිඩ් 19 ගෝලීය වසංගත තත්වය හේතුවෙන් නැවත ශ්‍රී ලංකාවට පැමිණි විගමනික ශ්‍රමිකයින්ගේ තොරතුරු ඔවුන් නිරෝධායනය වූ අදාළ නිරෝධායන මධ්‍යස්ථාන මාර්ගයෙන් කාර්යාංශය විසින් ලබාගන්නා අතර, එම තොරතුරු පදනම් කරගෙන ස්වයං රැකියාවල නිරතවීමට අපේක්ෂා කරන විගමනික ශ්‍රමිකයන්ට පමණක්, ඔවුන්ට අවශ්‍ය ස්වයං රැකියා උපකරණ ලබාගැනීම සඳහා එක් ශ්‍රමිකයෙකු වෙනුවෙන් උපරිම රුපියල් පනස් දහසකට (රු.50,000/= කට) යටත්ව ආධාර ලබාදීමේ වැඩසටහනක් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් දියත් කරනු ලබයි. එබැවින්, යූ ටියුබ් (Youtube) මාධ්‍ය මඟින් ප්‍රචාරය වන නිල නොවන ව්‍යාජ ප්‍රචාරවලට නොරැවටෙන ලෙස මහජනතාවගෙන් ඉල්ලා සිටිමි.

**සභාපති**
**ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය**